# රජයේ පාසල් ගුරුවරුන්ගේ ඊකියා තෘප්තිය ඉහළ නැංවීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සේවාවක අවශ්‍යතාව පිළිබඳ අධ්‍යයනයක්

වන්දනා කුමාරපේලි
M'Ed (Psychology), PGD in Counselling,
B'Ed (Hons), BA (Mass Communication)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණයකි

UCLIB
588906

University of Colombo
Sri Lanka
24 AUG 2015
Examination Branch
Colombo - 03

2010/M'Phill/S/07

# සංක්ෂිප්තය

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය ඉහළ නැංවීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සේවයක අවශ්‍යතාව සොයා බැලීමයි. කිසියම් වෘත්තියකට ප්‍රවිශ්ට වීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශය යොදා ගන්නා බව පෙනී ගිය ද එම වෘත්තියට ප්‍රවේශ වූවායෙන් පසුව ඒ පිළිබඳව සොයා නොබැලෙයි. රැකියාවක් කරගෙන යන අතරතුර හමුවන බාධා වළක්වාගෙන එය සිදු කර ගන්නේ කෙසේ ද යන පැනයට වෘත්තීය මාර්ගෝපදේශයෙන් විසඳුම් ලැබී නැත. මෙම හේතුව නිසා ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය ඉහළ නැංවීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශයෙන් කළ හැකි මෙහෙවර පිළිබඳව සොයා බැලීමට පර්යේෂිකාව පෙළඹෙන ලදී. ඒ අනුව මෙම පර්යේෂණයේ අපේක්ෂාව වන්නේ ගුරුවෘත්තිමය නියුක්තිකතාව තුළ අතෘප්තිකරණය විවිධාකාරීය තත්ත්ව ගැටලු සොයා බැලීම හා තෘප්තිකරණය සඳහා ගුරුභවතා බලගැන්වීමයි.

රැකියා තෘප්තිය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත්ව ඇතත් මෙහි සාමාන්‍ය අර්ථය වන්නේ සේවකයකු තම රැකියාව කෙරෙහි අභිරුචියෙන් හා අරුචියෙන් බලන ආකාරයයි. රැකියා තෘප්තිය පිළිබඳ පර්යේෂණ ක්ෂේත්‍රයේ කරන ලද විවිධ පර්යේෂණවලින් අනාවරණය වී ඇත්තේ රැකියා තෘප්තියේ ස්වභාවය ඔහු සේවය කරන ආයතනයේ කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට බෙහෙවින් බලපාන බවයි. එසේ නම් ශ්‍රී ලංකාවේ රජයේ පාසල් ගුරුවරුන්ගේ රැකියා තෘප්තියේ ස්වභාවය හා එයට බලපාන සාධක විමර්ශනය කිරීම පාසලටත්, අධ්‍යාපන ක්ෂේත්‍රයටත් ඉතා වැදගත් වේ. පාසල කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් යුත් ආයතනයක් බවට පත්කර ගැනීමේ මූලික වගකීම පැවරී ඇත්තේ ගුරුවරයාටය. කවර රටක හෝ පාසල් පද්ධතියේ සැම අතින්ම වැදගත්ම පුද්ගලයා වන්නේ ද ගුරුවරයායය. ගුරුවරයාට තම භූමිකාවට අයත් කාර්යභාරය මනාව හැසිරවීමට ඔහුට තම රැකියාවෙන් ලැබෙන්නා වූ තෘප්තියෙහි ස්වභාවය දැඩි බලපෑමක් කළ හැකි සාධකයක් වනු ඇත. එම නිසා ගුරුවරයාගේ රැකියා තෘප්තිය ඉහළ නැංවීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශයකින් යම් බලපෑමක් කළ හැකි නම් එය ගුරුවරයාට සිය කාර්යය ඉටු කිරීම සඳහා මහත් රුකුලක් වනු නිරනුමානය. මෙම පර්යේෂණයේ නියැදිය සඳහා ශ්‍රී ලංකාවේ විවිධ පළාත් නියෝජනය වන පරිදි ගුරුවරුන් 400 දෙනෙකු තෝරා ගැණිනි. රැස් කරගත් දත්ත කයි වර්ගයේ පරීක්ෂණ හා ප්‍රතිශත මගින් විශ්ලේෂණය කර බලන ලදි.

මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණු 4 ක් මත ගොඩනගන ලදී. එනම් රැකියා තෘප්තියේ ස්වභාවය සොයා බැලීම, රැකියා තෘප්තිය කෙරෙහි බලපාන සාධක සොයා බැලීම, රැකියා තෘප්තිය හා වෘත්තීය කැපවීම අතර සම්බන්ධතාවය පෙන්වාදීම හා ගුරුවරුන්ගේ රැකියා තෘප්තිය ඉහළ නැංවීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ සේවයක අවශ්‍යතාව විමර්ශනය කිරීම යනාදියයි.

# ABSTRACT


The purpose of this research is to study the need for a service of vocational guidance to raise the job satisfaction of the teachers of government schools in Sri Lanka. Though the vocational guidance is used to enroll into a particular job, it is not considered after recruitment to the job. It seems that, no solution from vocational guidance for the question of how to proceed with the job avoiding any obstacles encountered while doing the job. That is why the researcher is curious to look into this matter to see the need for a service of vocational guidance to raise the job satisfaction of the teachers. Accordingly, this research aims to study the different issues related to dissatisfaction of teaching as a profession and empower and guide the teacher for job satisfaction.

There are varied definitions on job satisfaction, but the general meaning of this is the way an employee is interested or not interested in his/her job. It has been revealed through research on job satisfaction that, the degree of the satisfaction level affects the efficiency and productivity of the organization. Hence, review of the level of job satisfaction of the teachers of government schools in Sri Lanka will be very important to the school and the education system as well. The teacher is responsible to make the school to be an efficient and productive institution. In any country the teacher is the very important person in the school system. The job satisfaction level of the teacher would be an effective factor of direction to play the role as a teacher. Therefore, if a service of vocational guidance could influence raising the job satisfaction of the teacher, it would immensely benefit the teacher to play the teacher's role very effectively.

The sample size for this research is four hundred (400) selected teachers representing different Provinces of Sri Lanka. Data will be analyzed using the Chi-square test.

The research was developed to achieve four main objectives. They are; (i) inquire the degree of job satisfaction; (ii) study the factors that affect the job satisfaction; (iii) show the co-relation between job satisfaction and job dedication; and (iv) study the need for a service of vocational guidance to raise the job satisfaction of the teacher.